# රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
# பதிவாளர் நாயகம் திணைக்களம்
# REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : RG/AB/01/චක්‍රලේඛ සහ කාර්යාල නියෝග

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. : 565

ඔබේ අංකය / உமது இல. / Your No. :

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date : 2022-08 18


චක්‍රලේඛ අංක : 13/2022

ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන්
මධ්‍යම ලේඛණාගාරය/පළාත් ලේඛණාගාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
කලාප භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්
ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන්
සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්

<u>විද්‍යුත් තැපැල භාවිතා කිරීම</u>

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව මේ වනතෙක් ලිපි ගනුදෙනු කිරීම බහුලව තැපැල් මගින් සිදුකලද, රාජකාරි ලිපි තැපැල මගින් ප්‍රමාදවීම් මෙන්ම අස්ථානගතවීමද සිදුවන අවස්ථා නිරීක්ෂණය වේ. එම තත්ත්වය මගහරවා ගැනීමට විද්‍යුත් තැපැල භාවිතය මහත් පිටුවහලක් වන බවට තීරණය කර ඇත.

02. ඒ අනුව, 2022-09-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි විද්‍යුත් තැපැල භාවිතා කිරීම මගින් ලිපි-ගනුදෙනු කිරීම නියමු ව්‍යාපෘතියක් වශයෙන් නිත්‍යානුකූලව සිදුවන බවත්, මේ සමග ඇති ඇමුණුම-1 හි සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයන් භාවිතා කිරීමට සටහන් කරගන්නා ලෙසත් දන්වමි.

03. LGN WIFI ඔස්සේ රජයේ විද්‍යුත් තැපැලට පිවිසීම සඳහා පරිශීලක මාර්ගෝපදේශ මාලාව මේ සමග අමුණා ඇත. ඒ අනුව මේ සමග ඇති පහත සඳහන් තොරතුරු හා උපදෙස් භාවිතා කර E-mail ලිපින වලට ඇතුළුවීම හා අදාල E-mail ගනුදෙනු කිරීම සිදු කල හැක.

- ලංකා රාජ්‍ය ජාලය භාවිතා කර E-mail ගණු දෙණු සිදුකල හැකි අකර https://lgn.gov.lk/owa/URL එක මගින් E-mail ලිපිනයට ඇතුළු වීම (Log in) සිදු කල හැක.
- ගිණුමට ඇතුළු වීම (Log in) සඳහා, මින් පෙර ඔබ වෙත ලබාදී ඇති පරිශීලක නාමය (USER NAME) හා මුරපදය (PASS WORD) භාවිතා කල යුතුය.
- E-mail ගණුදෙණු කිරීම සඳහා ඔබ විසින් ඉහත උපදෙස් මත log වන පළමු අවස්ථාවේදීය ඔබට ලබා දී ඇති පොදු මුරපදය (PASS WORD) වෙනස් කර ගත හැක.
- E-mail පණිවිඩය යැවීමේදී to හි සඳහන් ලිපිනයට අමතරව cc හි ඔබගේ වෙනත් පුද්ගලික E-mail ලිපිනයක් සඳහන් කිරීම තුලින් ඔබ යවනු ලබන පණිවුඩය නිවැරදිව send වූවාද යන්න ඔබට තහවුරු කරගත හැක.
- ඔබ යවනු ලබන E-mail පණිවුඩ වල අනවශ්‍ය පණිවුඩ යැවීම් හෝ ලැබීම් මසකට වරක්වත් ඉවත් කරගැනීමට කටයතු කරන්න.

04. E-mail ලිපින වල හෝ මුරපද (PASS WORD) වල හෝ වෙනත් ඕනෑම තාක්ෂණික ගැටළුවක් සඳහා ලංකා රාජ්‍ය ජාලයේ අංක 0112497900 අමතා ඔබට උපදෙස් ලබා ගත හැක.

05. භාවිතයේදී පැන නගින තාක්ෂණික ගැටළු සම්බන්ධයෙන් තොරතුරු තාක්ෂණ අංශය මගින් අවශ්‍ය පහසුකම් සපයා ගන්නා ලෙසත්, තොරතුරු පත්‍රිකාව ඇමුණුම-2 මගින් ලබාදී ඇති උපදෙස් පරිදි විද්‍යුත්

තැපැල භාවිතා කරන ලෙසත්, දෛනිකව විද්‍යුත් තැපැල සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී වෙත රාජකාරී පවරන ලෙසත් මෙයින් වැඩිදුරටත් දන්වමි.

**පී.එස්.පී.අබේවර්ධන**
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

**පී. එස්. පී. අබේවර්ධන**
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.